ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No | ඔබේ අංකය<br>உமது இல.<br>Your No | දිනය<br>திகதி<br>Date 2024-02-14 |

පැමිණිලි පාර්ශවය : මහාචාර්ය එම්.ඩබ්.සී.එන්.කේ.රඹුක්වැල්ල මිය,
අංක. බී 14, විශ්ව විද්‍යාල නිල නිවස,
මීවතුර, පේරාදෙණිය.

වගඋත්තර පාර්ශවය : 01. මහාචාර්ය ආනන්ද ජයවික්‍රම මහතා,
වැඩබලන අංශාධිපති,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
පේරාදෙණිය.

02. ආචාර්ය ප්‍රභාත් ඒකනායක මහතා,
පීඨාධිපති,
ශාස්ත්‍ර පීඨය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
පේරාදෙණිය.

03. මහාචාර්ය එම්.ඩී.ළමාවංශ මයා,
උපකුලපති,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
පේරාදෙණිය.

04. මහාචාර්ය ටෙරන්ස් මධුජිත් මයා,
වැඩබැලූ උපකුලපති,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
පේරාදෙණිය.

පැමිණිලි අංකය : HRC/KND/48/23/W



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ-04. / இல.14, ஆர்.ஏ.டி.மெல் மாவத்தை, கொழும்பு-04. / No.14, R.A. De Mel Mawatha, Colombo-04.
සභාපති / தவிசாளர் / Chaiman: 011-2505551
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / Email: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hresl.lk

**පැමිණිලි පාර්ශවයේ සැළකිරීම් :-**

ඉහත නම් සඳහන් පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරාවිද්‍යා මුලාසන මහාචාර්යවරිය ලෙස කටයුතු කරන බවත්, තමාට විදේශ සමුළුවකට සහභාගීවීම සඳහා දින 09ක නිවාඩු ලබාගැනීමට අදාළව තමාගේ විදේශ නිවාඩු ඉල්ලුම් පත්‍රය 2023.01.18 වන දින මධ්‍යම රාත්‍රි 12.00 ට පමණ යොමු කරන ලද බවත්, 2023.01.19 දින එකී නිවාඩු ඉල්ලුම්පත්‍රය පිළිබඳ කිසිදු කටයුත්තක් සිදු නොවූ බැවින් 2023.01.20 වන දින ඒ පිළිබඳව අවධානය යොමු කර හැකි ඉක්මණින් මෙම ඉල්ලුම් පත්‍රය අදාළ අංශ වෙත යොමු කරන ලෙස දන්වා විද්‍යුත් ලිපියක් මගින් වැඩබලන අංශාධිපති මහාචාර්ය ආනන්ද ජයවික්‍රම මහතා වෙත යවන ලද බවත්, ඒ සමගම මේ පිළිබඳව අදාළ බලධාරීන් දැනුවත් කරන ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කළමණාකරන සහකාර දිනුෂා සමරනායක හා ශානිකා මහලියද්ද යන අයද දැනුවත් කළ බවත් සඳහන් කර ඇත. තමාගේ ලිපියට පිළිතුරු ලෙස මහාචාර්ය ආනන්ද ජයවික්‍රම මහතා විසින් 2023.01.20 දිනැති ලිපියක් යොමු කර තිබූ අතර, එහි දන්වා තිබුනේ, දෙපාර්තමේන්තු සාමාජිකයන් විභාග කටයුතු සම්පූර්ණ කළ යුතු බවත්, එය සොයා බලා තමාගේ නිවාඩු අනුමත කිරීම පිළිබඳ තීරණයක් ගනු ලබන බවයි. ඒ අනුව තමා විසින් 2023.01.22 දින යොමු කරන ලද විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් තමාගේ විභාග කටයුතු අවසන් කර ඇති බවත් යමක් ඉතිරි වී ඇත්නම් විදේශගතවීමට ප්‍රථම ඒවා අවසාන කර භාර දෙන බවත් දැන්වූ බව සඳහන් කර ඇත.

2023.01.22 වන විටද තමාගේ ඉල්ලුම්පත්‍රය අදාළ අංශ වෙත යොමු වී නොතිබූ අතර, ඒ අනුව තමාගේ නිවාඩු අනුමැතිය ප්‍රශ්නයක් විය හැකි බැවින් මෙයට මැදිහත් වන ලෙස ඉල්ලා උපකුලපති මහාචාර්ය එම්.ඩී.ළමාවංශ මහතා වෙත තමා තවදුරටත් කරුණු දන්වා ලිපියක් යොමු කළ බවත්, එයට පිළිතුරු ලෙස වැඩබලන උපකුලපති විසින් 2023.01.24 දින තමා වෙත ලිපියක් යොමු කරමින්, අදාළ ගැටළුව විසඳී ඇති බව දන්වන ලද බවත් දක්වා ඇත. නමුත් 2023.01.25 වන දින අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුනු ලිපියේ නිවාඩු ක්‍රියාවලිය තවමත් අසම්පූර්ණ බවත්, එයට මුදල් භාවිතය පිළිබඳ ලේඛනය අමුණා නොමැති බවත් දන්වා ඇති අතර, එය කළයුතුව තිබුනේ විශ්ව විද්‍යාලයේ අධ්‍යයන ආයතන අංශය විසින් වන බවත්, මෙම ප්‍රමාදයට හේතුව වන්නේ 2023.01.19 දින තමා දෙපාර්තමේන්තුව වෙත බාරදෙන ලද මුදල් පරිහරණය කරන පිළිවෙල දන්වන ලද ලිපිය නියමිත ආකාරයට අදාළ අංශ වෙත නොලැබීම බවත්, තමා මෙම ලිපිය පිළිබඳව දිගින් දිගටම වාචිකව හා ලිඛිතව දැනුම් දුන්නද ශාස්ත්‍ර පීඨයේ මුල්‍යාධිකාරි චතුරානි මිය භාරයේ දින කිහිපයක් රඳවා තබාගෙන ඇති බවත්, ඒ අනුව තමාගේ නිවාඩු අනුමත කිරීම 2023.01.31 දින වන තෙක්ම සිදුකර නොමැති බවත් දක්වා ඇත.

එදින එනම්, 2023.01.31 වන දින තමා නැවත වතාවක් පීඨාධිපතිතුමා හමුවී මේ පිළිබඳ සොයා බැලීමට පීඨාධිපති කාර්යාලයට ගිය නමුත් ඔහු නිවාඩු ගොස් සිටි අතර, ඒ සඳහා වැඩබැලූ පීඨාධිපති ලෙස කටයුතු කළ

මහාචාර්ය නාමලී හඳගම මිය පවසා සිටින ලද්දේ, එකී ලිපිය අදාළ අංශවලට තවම යවා නොමැති නම් එය හැකි ඉක්මණින් යොමු කිරිමට කටයුතු යොදන බවත්ය. නමුත් ඉන් ඔබ්බට සිදුවූ ක්‍රියාවලිය පිළිබඳ තමාට අපහැදිලිතාවයක් ඇති බවත්, ඒ හේතුවෙන් මෙම සමුළුවට සහභාගිවීමට අවස්ථාව නොලැබීම සම්පූර්ණයෙන්ම හිතාමතා, ද්වේශ සහගතව, සැලසුම් සහගතව දවස් 09ක නිවාඩු අනුමත නොකර තමාගෙන් පළිගැනීමේ චේතනාවෙන් සිදුකර ඇති බවත්, ඒ තුළින් තමාගේ අධ්‍යාපනය සඳහා ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර වෙනස්කොට සැළකීමත්, තමාට විශේෂ වරප්‍රසාද සහිතව ලැබුණු අන්තර් ජාතික සමුළුවකට සහභාගිවීමේ අවස්ථාව වැළැක්වීමත් මඟින් තමාට අගතියක් සිදුකර ඇති බවත්, විශේෂයෙන්ම තමාට ලැබෙන අධ්‍යාපන චාරිකාවට සහභාගි වීමට තිබූ අවස්ථාව විශ්ව විද්‍යාල බලධාරින් විසින් අභිමිකර තම විදේශ නිවාඩු අනුමත කිරිම පැහැර හැරීමට කටයුතු කිරිම සිදුකර ඇති බවත්, සඳහන් කර සිටින අතර, මේ පිළිබඳව සාධාරණයක් ඉටුකර දෙන මෙන් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

**වගඋත්තර පාර්ශවීය සැළකිරිම් :-**

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවීය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපකුලපති වෙතින් කැඳවන ලද 2023.02.16 දිනැති වාර්තාවෙන් කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාර මහාචාර්ය එම්.ඩබ්.සී.එන්.කේ.රඹුක්වැල්ල මහත්මිය විසින් විදේශ නිවාඩු අයදුම්පතක් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කරමින් 2023.02.02 සිට 2023.02.05 දින දක්වා ඉන්දියාවේ පවත්නා ජාත්‍යන්තර සම්මන්ත්‍රණයකට සහ අධ්‍යාපන චාරිකාවකට සහභාගී විම සඳහා නිවාඩු ඉල්ලීමක් සිදුකර ඇති බවත්, එකී නිවාඩු අයදුම්පත අංශ ප්‍රධානි සහ පීඨාධිපතිතුමා විසින් 2023.01.24 වන දින මාර්ගගත ක්‍රමය ඔස්සේ නිර්දේශ කර විශ්ව විද්‍යාල අධ්‍යයන ආයතන අංශය වෙත යොමු කර ඇති බවත්ය.

විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලයේ විදේශ නිවාඩු අනුමත කිරිමේ බලතල ඇත්තේ, අමාත්‍යාංශ ලේකම්වරයාට බැවින් මෙම මාර්ගගත ක්‍රමය හරහා නිවාඩු අයදුම්පත නිසි ධූරාවලිය හරහා අදාළ අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළයුතු බවත්, එසේ යොමු කිරීමට පෙර විශ්ව විද්‍යාලයේ අධ්‍යයන ආයතන අංශය විසින් එම නිවාඩු අයදුම්පත ස්වයංක්‍රීයව පරිගණක පද්ධතිය මඟින් ක්‍රියාවලියකට ලක්කරනු ලබන බවත්, එම ක්‍රියාවලිය සිදුකිරිම සඳහා මාර්ගගත ක්‍රමයේදී නිවාඩු අයදුම්පත අදාළ අධ්‍යයන ආයතන අංශය වෙත දින 08කට පෙර යොමුවිය යුතු බවත්, එසේ නොමැති අවස්ථාවලදි මාර්ගගත ක්‍රමය හරහා විදේශ නිවාඩු ඉල්ලුම්පත සැකසුම් කිරිම සිදුකිරිමට නොහැකි වන බවත් දක්වයි.

මෙම පැමිණිලිකාර මහාචාර්යවරියගේ මාර්ගගත ක්‍රමය හරහා ඉදිරිපත් කරන ලද අයදුම්පත 2023.01.25 දින අධ්‍යයන ආයතන අංශය වෙත ලැබී ඇති බවත්, එහිදි සිදුවන ක්‍රියාවලියේදී එකී අයදුම්පත දින 08ක කාල සීමාවක් නොමැතිවීමත්, රාජ්‍ය මුදල් යොදා නොගන්නා බවට ලිපියක් අමුණා නොමැති වීමත් හේතුකොට ගෙන එම

අයදුම්පත පරිගණක පද්ධතිය මගින් ඉදිරි කටයුතු සිදුකිරිම ස්වයංක්‍රීයව නැවතීමකට ලක්වී ඇති බවත් සඳහන් කර ඇත.

එලෙස මෙම නිවාඩු අයදුම්පත ස්වයංක්‍රීයව පරිගණක පද්ධතිය මගින් ක්‍රියාවලියට ලක්කිරිමට නොහැකි වීම හේතුවෙන් නිවාඩු ලබාදීම සඳහා කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව විශ්වවිද්‍යාල අධ්‍යයන ආයතන අංශය මගින් අමාත්‍යාංශයේ විෂයභාර නිලධාරින් සමඟ සාකච්ඡා කිරිමෙන් පසු දැනුම් දී ඇත්තේ, මාර්ගගත ක්‍රමය හඳුන්වාදීමට පෙර තිබූ ක්‍රමවේදය අනුව නිවාඩු අයදුම්පතෙහි දෘඩ පිටපතක් ලබාගෙන ඉදිරි කටයුතු සිදුකරන ලෙසයි. ඒ අනුව දෘඩ පිටපතක්ද අදාළ ලියවිලි සමඟ නැවත ලබාදෙන ලෙස මහාචාර්ය රඹුක්වැල්ල මහත්මිය වෙත දුරකථන ඇමතුමක් මගින් අධ්‍යයන ආයතන අංශය විසින් දැනුවත් කිරිමෙන් පසු අදාළ අංශය වෙත පැමිණ එකී පිටපත් ලබාගෙන තිබුණද එය නැවත භාරදීමට කටයුතු කර නොමැති බවත්, අදාළ අයදුම්පත නැවත ලබානොදීම සම්බන්ධයෙන් 2023.02.01 දිනැතිව විද්‍යුත් තැපැල මගින් අධ්‍යයන ආයතන අංශය ඇයව දැනුවත් කර ඇති බවත්, මහාචාර්යවරිය රාජ්‍ය අරමුදල් සම්බන්ධයෙන් ලබාදෙන ලද ලිපිය අධ්‍යයන ආයතන අංශය වෙත ලබාදී ඇත්තේ, 2023.01.31 දින සවස 4.30 ට බවත් දක්වා ඇත.

මෙම පැමිණිලිකාර රඹුක්වැල්ල මහත්මිය ඇයගේ 2023.01.19 දිනැති ලිපිය මගින් විදේශගත වීම සඳහා යන පිරිවැයෙන් යම් කොටසක් ලබාදෙන ලෙසට කරන ලද ඉල්ලීම, රජයේ වියදම් අවම කිරිම සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛනය අනුව ගෙවීමට හැකියාවක් නොමැති බවට උපකුලපතිතුමා විසින් 2023.02.01 දින ඇය වෙත දන්වා ඇති බවද සඳහන් කර ඇත.

තවද, 2023.01.24 දින අංශාධිපති, මහාචාර්ය ජේ.එම්.ඒ ජයවික්‍රම මහතා විසින් පැමිණිලිකාරියගේ අයදුම්පත පරික්ෂා කිරීමේදී පැමිණිලිකාරියගේ රාජකාරී කටයුතු ආවරණය සඳහා කථිකාචාර්ය (පරිවාස) සන්ධ්‍යා කුමාරි නවරත්න මැණිකේ යන අයගේ නම යෝජනා කර තිබූ අතර, 2023.02.25 සන්ධ්‍යා කුමාරි නවරත්න මැණිකේ කථිකාචාර්යවරිය විසින්, ඇයගේ අනුමැතියකින් තොරව මෙම පැමිණිලිකාරිය විසින් ඇයගේ වැඩ ආවරණය සඳහා මාගේ නම ඇතුළත් කොට ඇති බවට දන්වා ඇති බවද සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති 2023.02.13 දිනැති වාර්තාවෙන්, මෙම පැමිණිලිකාරිය ACL 3001හා ACL 4001/401 යන විෂයන්ට අදාළ උත්තර පත්‍ර පරීක්ෂා කිරීම ප්‍රතික්ෂේප කොට අදාළ උත්තර පත්‍ර දෙපාර්තමේන්තුවේ කළමණාකාර සහකාරවරියට බලෙන්ම නැවත භාරදී තිබූ බවද ඒ අනුව විභාග කටයුතු පැහැර හැරිම වැනි රාජකාරී කටයුත්තක් පැහැර හැරීම සිදුකර ඇති තත්වයකදී රාජකාරී නිවාඩු අනුමත කළ නොහැකි බැවින් අදාළ උත්තරපත්‍ර ලකුණු කිරීමට භාරගන්නා ලෙසට අංශාධිපතිවරයා විසින් පැමිණිලිකාරිය වෙත දන්වන ලද බවද සඳහන් කර ඇත. කෙසේ වෙතත්, 2023.01.23 වන දින පැමිණිලිකාරිය අදාළ උත්තර පත්‍ර පරික්ෂා කිරීම සඳහා භාරගෙන තිබූ බවද දක්වා ඇත.

මෙම මහාචාර්ය රඹුක්වැල්ල මහත්මියගේ විදේශ නිවාඩු අයදුම්පත මාර්ගගත ක්‍රමය ඔස්සේ නියමිත දින ගණන තුළ ස්වයංක්‍රීය ක්‍රියාවලියට භාජනය නොවීම තුළ හා රාජ්‍ය මුදල් භාවිතා නොකරන බවට ලිපියක් ඉදිරිපත් නොකිරීම තුළ එකී අයදුම්පත අමාත්‍යංශ ලේකම් වෙත යැවීමට නොහැකි වීම සිදුවී ඇති බවත්, ඒ අනුව ඇයගේ මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් විශ්වවිද්‍යාලය විසින් හෝ මෙම පැමිණිල්ලේ නම් සඳහන් කිසිදු නිලධාරිවරයෙකු විසින් සිදුකර නොමැති බවත් පවත්නා නීති රෙගුලාසි අනුව සද්භාවයෙන් යුතුව කටයුතු කර ඇති බවත් වැඩිදුරටත් කියාසිටි.

**පරීක්ෂණ හා විමර්ශන කටයුතුවලින් අනාවරණය වී ඇති කරුණු :-**

01. පැමිණිලි පාර්ශවය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරා විද්‍යා මූලාසන මහාචාර්යවරිය ලෙස සේවය කරනු ලබයි.

02. 2023.02.02 වන දින සිට 2023.02.05 වන දින තෙක් ඉන්දියාවේ රාජස්තාන්, උඩයිපූර් හී 'මෝහන්ලාල් සුකාදිආ ප්‍රතාදිෂා' විශ්ව විද්‍යාලයේ පැවැත්වෙන ජාත්‍යන්තර සමුළුවක මූලාසනය දැරීම සඳහා පැමිණිලිකාරියට ආරාධනාවක් ලැබී ඇත.

03. උක්ත ජාත්‍යන්තර සමුළුවට සහභාගීවීම සඳහා 2023.02.01 වන දින සිට 2023.02.09 වන දින දක්වා දින 09ක කාලයක් සඳහා නිවාඩු ලබාගැනීම සඳහා නියමිත ධූරාවලිය අනුව නිවාඩු අයදුම්පත මාර්ගගත ක්‍රමය ඔස්සේ 2023.01.19 වන දින අංශාධිපති වෙත පැමිණිලිකාරිය විසින් යොමු කර ඇත.

04. විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා විදේශ නිවාඩු අනුමත කිරීමේ බලධාරියා වන්නේ, උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්වරයා වේ. ඔහු වෙත යොමු කිරීමට පෙර අදාල අයදුම්පත විශ්ව විද්‍යාල අධ්‍යයන ආයතන අංශය විසින් ස්වංක්‍රීය පරිඝනකත පද්ධතිය මගින් ක්‍රියාවලියට භාජනය කරනු ලබන අතර, ඒ සඳහා අදාළ නිවාඩු අයදුම්පත අධ්‍යයන ආයතනය වෙත නිවාඩු ආරම්භ වීමට නියමිත දිනට දින 08කට පෙර ලැබිය යුතු වේ. ඒ අනුව පැමිණිලි පාර්ශවය නිවාඩු ආරම්භ වන දිනට දින 13කට පෙර අදාළ නිවාඩු අයදුම්පත ඉදිරිපත් කර ඇති බව තහවුරු වේ.

05. පැමිණිලි පාර්ශවය විදේශ නිවාඩු අයදුම්පත 2023.01.19 වන දින ශාස්ත්‍ර පීඨයේ අංශාධිපති වෙත යොමු කළද, ඔහු විසින් එය නිර්දේශ කර පීඨාධිපති වෙත යොමුකර ඇත්තේ, 2023.01.24 දින වේ. ඒ අනුව අදාළ නිර්දේශය ලබාදී පීඨාධිපති වෙත යොමු කිරීම සඳහා දින 05ක කාලයක් ගතවී ඇති බව පෙනී යයි.

06. අංශාධිපති විසින් 2023.01.24 දින නිර්දේශ කර පීඨාධිපති වෙත ඉදිරිපත් කර ඇති පැමිණිලි පාර්ශවීය විදේශ නිවාඩු අයදුම්පත පීඨාධිපති විසින් 2023.01.25 වන දින අධ්‍යයන ආයතන අංශය වෙත යොමු කර ඇතත්, ඒ සමග යොමු කළ යුතු පැමිණිලි පාර්ශවය විසින් 2023.01.19 දින ලබාදී ඇති රාජ්‍ය මුදල් භාවිතය පිළිබඳ ලිපිය අධ්‍යයන ආයතන අංශය වෙත යොමුකර නොමැති බව තහවුරු වන අතර, අදාළ ලිපිය අධ්‍යයන ආයතන අංශය වෙත ලැබී ඇත්තේ, 2023.01.31 දින සවස 4.30 ට වේ.

07. වගඋත්තර පාර්ශවීය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයාගේ වාර්තාවේ වැඩිදුරටත් සඳහන් වන්නේ, පැමිණිලිකාරියගේ ජාත්‍යාන්තර සමුළුවට සහභාගිවීමේදී රාජ්‍ය මුදල් යොදා නොගන්නා බවට ලිපියක් අමුණා නොමැතිවීම හේතුවෙන් ස්වංක්‍රීය පරිඝනක පද්ධතිය හරහා නිවාඩු අනුමත කරගැනිමේ ක්‍රියාවලිය අක්‍රීයවී ඇති බවයි. එහෙත් එවැනි ලිපියක් ඉදිරිපත් කරන ලෙස අධ්‍යයන ආයතන අංශය මගින් පැමිණිලි පාර්ශවය වෙත දන්වා ඇත්තේ, 2023.02.01 වන දින ප.ව.3.48 ට බව තහවුරු වේ.

08. උපකුලපතිවරයාගේ වාර්තාවේ වැඩිදුරටත් සඳහන් වන්නේ, පැමිණිලි පාර්ශවය ජාත්‍යන්තර වැඩමුළුවට යාමට අවශ්‍ය නිවාඩු අනුමත කිරිමේදී විදේශගතවීම සඳහා යන පිරිවැයෙන් කොටසක් ලබාදෙන ලෙස ඉල්ලා ඇතත්, දැනට පවත්නා රජයේ වියදම් අවම කිරිම සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛනය ප්‍රකාරව ඉල්ලා ඇති මුදල් ලබාදීමේ හැකියාවක් නොමැති බව 2023.02.01 වන දින ඇය වෙත දන්වා ඇති බවයි. ඒ අනුව අදාළ මුදල් ලබාදීමේ හැකියාව නොමැත්තේ නම් ඒ සඳහා රජයේ මුදල් භාවිතා නොකරන බවට ලිපියක් ඉල්ලීමේ අවශ්‍යතාවයක් නොමැති අතර, අදාළ මුදල් ලබානොදිමට යටත්ව නියමිත කාලසීමාව තුළ නිවාඩු අනුමත කිරිමේ හැකියාවක් ඇති නමුත්, ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොමැති බව තහවුරු වේ.

09. උපකුලපතිවරයාගේ වාර්තාවේ වැඩිදුරටත් සඳහන් වන්නේ, පැමිණිලි පාර්ශවයේ විදේශ නිවාඩු අයදුම්පත ස්වයංක්‍රීය පරිඝනක පද්ධතිය මගින් ක්‍රියාවලියට ලක්කිරිමට නොහැකිවීම මත අමාත්‍යාංශයේ නිලධාරින් සමග සාකච්ඡා කර පැරණි ක්‍රමවේදය අනුව නිවාඩු අයදුම්පතේ දෘඩ පිටපතක් ලබාගෙන ඉදිරි කටයුතු සිදුකිරිම සඳහා දෘඩ පිටපතක් අදාළ ලියවිලි සමඟ ලබාදෙන ලෙස පැමිණිලි පාර්ශවය වෙත දුරකථනයෙන් දැන්වූ බවත්, ඒ අනුව අදාළ ආකෘතිපත්‍ර පැමිණිලි පාර්ශවය ලබාගෙන තිබු නමුත් එය සම්පූර්ණ කොට භාරදී නොමැති බවයි. එහෙත් දුරකථනයෙන් තමා වෙත දැනුම්දීමක් කළ බවට කරනු ලබන ප්‍රකාශය පැමිණිලිකාරිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අතර, වගඋත්තරකරුවන් විසින්ද පැමිණිලිකාරිය හට දුරකතන ඇමතුමක් ලබාදුන් බවට තහවුරු කිරිම සඳහා කිසිදු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් කර නොමැත. නිල වශයෙන් එම දැනුම්දීම විද්‍යුත් තැපැල මඟින් දැනුම්දීම සිදුකර ඇත්තේ, 2023.02.01 වන දින බව තහවුරු වේ. ඒ අනුව පෙනී යන්නේ පැමිණිලිකාරියගේ විදේශ නිවාඩු අනුමත කිරිම ස්වයංක්‍රීය පරිඝනක පද්ධතිය හරහා සිදුකිරිම 2023.01.26 දින වන විට අක්‍රීය වුයේ නම් සාමාන්‍ය ක්‍රමවේදය යටතේ අදාළ කටයුතු සිදුකිරිම එදිනම සිදුකළ හැකි නමුත් ඒ සඳහා වගඋත්තර පාර්ශවය කිසිදු

උත්සාහයක් ගෙන නොමැති බවයි. එමෙන්ම වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකාරියගේ නිවාඩු අනුමත කිරීම සඳහා වූ ප්‍රමාදයට එක් හේතුවක් ලෙස පැමිණිලිකාරියගේ නිවාඩු අනුමැතිය සඳහා අවශ්‍ය රාජකාරී වැඩ ආවරණය සඳහා නම් කොට ඇති කථිකාචාර්යවරිය එකී කටයුතු ආවරණය කිරීමට ඇයට නොහැකි බව දන්වා ඇති බව දක්වයි. එහෙත් පසුකාලීනව මෙම නිවාඩු අයදුම්පත අමාත්‍යාංශය මඟින් අනුමත කිරීම මඟින් මෙසේ රාජකාරී කටයුතු ආවරණය යන කාරණය නිවාඩු අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට මූලිකවම බලපාන කාරණයක් නොවන බව පෙනී යයි.

10. ඒ අනුව පෙනී යන්නේ, පැමිණිලි පාර්ශවයට අදාළ ජාත්‍යාන්තර සමුළුව සඳහා 2023.02.01 වන දින දිවයිනෙන් පිටත්ව යාමට තිබියදී සාමාන්‍ය ක්‍රමවේදය යටතේ විදේශ නිවාඩු අයදුම්පතක් ඉදිරිපත් කරන ලෙස දැනුම්දීම සාධාරණ පදනමක් මත පිළිගත නොහැකි කරුණක් බවයි.

11. පැමිණිලි පාර්ශවය විසින් තමාගේ විදේශ නිවාඩු අයදුම්පත 2023.01.19 වන දින ශාස්ත්‍ර පීඨයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අංශාධිපති වන මහාචාර්ය ජේ.එම්.ඒ.ජයවික්‍රම මහතා වෙත යොමු කිරීමෙන් පසු තමන්ගේ විදේශ නිවාඩු අයදුම්පත කඩිනමින් නිරේදේශ කර යවන ලෙස දන්වා 2023.01.20, 2023.01.22 හා 2023.01.23 යන දිනවලදි විද්‍යුත් තැපැල මඟින් ඉල්ලීම් කර ඇතත්, අදාළ නිර්දේශය ලබාදී ඇත්තේ, 2023.01.24 දින බව ඔහුගේ වාර්තාවේ සඳහන් වේ. මෙහිදී පැමිණිලිකාරිය විසින් 2023.01.20 දින යොමු කරන ලද විද්‍යුත් පණිවිඩයකට පිළිතුරු යොමු කරමින් මහාචාර්ය ආනන්ද ජයවික්‍රම මහතා විසින්, දෙපාර්තමේන්තු සාමාජිකයන් විභාග කටයුතු සම්පූර්ණ කළ යුතු බවත්, එය සොයා බලා පැමිණිලිකාරියගේ නිවාඩු අනුමත කිරීම පිළිබඳ තීරණයක් ගනු ලබන බවට දන්වා ඇති බවත් පෙන්වා දී ඇත. එහිදී පැමිණිලිකාරිය විසින් 2023.01.22 දින යොමු කරන ලද විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් තමාගේ විභාග කටයුතු අවසන් කර ඇති බවත් යමක් ඉතිරි වී ඇත්නම් විදේශගතවීමට ප්‍රථම ඒවා අවසාන කර බාර දෙන බවට දැන්වූ බවද සඳහන් කර ඇත.

මේ අනුව අදාළ ප්‍රමාදයට කිසිදු සාධාරණ හේතුවක් වගඋත්තර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත දන්වා නොමැති නමුත් අංශාධිපති විසින් දන්වා ඇත්තේ, නිවාඩු අයදුම්පත දෙපාර්තමේන්තු නිලධාරින්ගේ විදේශගත නිවාඩු අනුමත කිරීමේ නිල වෙබ් අඩවියට පිවිසීමේ ගිණුම හා මූරපදය අධ්‍යයන ආයතන අංශයෙන් තමන් වෙත ලබාදෙන ලද්දේ 2023.01.24 දින බැවින් එදිනට නිවාඩු අයදුම්පත මාර්ගගත ක්‍රමය ඔස්සේ නිර්දේශ කොට යවන ලද බවයි. එහෙත් අයදුම්පත ඉදිරිපත් කර රාජකාරී දින 04ක් තිබියදි එය නිර්දේශ නොකිරීම මඟින් පැමිණිලිකාරියට සිදුවී ඇති අගතියට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අංශාධිපතිවරයා සෘජුවම වගකීම දැරිය යුතු වේ.

12. පැමිණිලි පාර්ශවයේ නිවාඩු අනුමත කිරීම ප්‍රමාදවීම සම්බන්ධයෙන් මැදිහත්වන ලෙස දන්වා පැමිණිලි පාර්ශවය විසින් එවකට උපකුලපති ධූරයේ වැඩබැලූ නියෝජ්‍ය උපකුලපති වෙත 2023.01.23 වන දින විද්‍යුත් තැපැල මඟින් දන්වා ඇති අතර, එයට පිළිතුරු ලෙස නියෝජ්‍ය උපකුලපති විසින් 2023.01.24 වන දින පැමිණිලි පාර්ශවය වෙත විද්‍යුත් තැපැල මඟින් එවා ඇති පිළිතුරු ලිපියෙහි සඳහන් වන්නේ, නිවාඩු අනුමත කිරීමේ ගැටළුව විසඳී ඇති බවයි. එහෙත් අදාළ ගැටළුවට විසඳුම් නොලැබීම සම්බන්ධයෙන් මැදිහත් වන ලෙස දන්වා පැමිණිලි පාර්ශවය නැවත නියෝජ්‍ය උපකුලපති වෙත 2023.01.25 වන දින විද්‍යුත් තැපැල මගින් අවස්ථා දෙකකදී දන්වා ඇතත්, ඒ සඳහා පිළිතුරු ලබාදීමක් හෝ මැදිහත්වීමක් සිදුකර නොමැත. ඒ අනුව පෙනී යන්නේ, පැමිණිලි පාර්ශවීය ගැටළුව විසඳීම සඳහා නියෝජ්‍ය උපකුලපතිවරයාද නිසි මැදිහත්වීමක් සිදුකර නොමැති බවත්, ඒ අනුව ඔහුගේ වගකීම් පැහැර හැර ඇති බවත්ය.

13. පැමිණිලිකාරියගේ ජාත්‍යන්තර සමුළුව සඳහා නිවාඩු අනුමත කිරීමට රාජ්‍ය මුදල් යොදා නොගන්නා බවට ලිපියක් පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් නිවාඩු අනුමත කිරීමට නොහැකි වූ බවට කොමිෂන් සභාව වෙත වාර්තා කළ උපකුලපතිවරයා එවැනි ලිපියක් නොමැතිව 2023.02.01 වන දින පැමිණිලි පාර්ශවය විදේශගතවීමට නියමිත දින අදාළ අනුමැතිය ලබාදී අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්ගේ අනුමැතිය සඳහා යොමු කිරීම මගින් පෙනී යන්නේ, අදාළ නිවාඩු අනුමත කිරීමට කිසිදු නීතිමය බාධාවක් නොතිබියදී එය අනුමත කිරීම ප්‍රමාද කිරීම හේතුවෙන් පැමිණිලිකාරියට අදාළ ජාත්‍යන්තර සමුළුවට සහභාගි වීමේ අවස්ථාව වගඋත්තර පාර්ශවීය නිලධාරින්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් අහිමි වී ඇති බවයි.

**නිගමනය :-**

පැමිණිලි පාර්ශවය විසින් ඉන්දියාවේ පැවැත්වෙන ජාත්‍යන්තර සමුළුවක් සඳහා යාමට අවශ්‍ය විදේශ නිවාඩු අනුමත කරගැනීමට නියමිත ක්‍රමවේදය අනුව නියමිත කාලසීමාව තුළ අනුමත කරගැනීමට ඉදිරිපත් කරන ලද අයදුම්පත කිසිදු සාධාරණ හේතුවක් හෝ නීතිමය බාධාවක් නොතිබියදී නියමිත කාල සීමාවේදී අත්තනෝමතික ලෙස අනුමත නොකිරීම හේතුවෙන් පැමිණිලි පාර්ශවයට අදාළ ජාත්‍යන්තර සමුළුවට සහභාගීවීමට තිබූ අවස්ථාව අහිමිකිරීම මඟින් වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලි පාර්ශවයට, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01. පළමුවන වගඋත්තරකාර පාර්ශවයට එරෙහිව සුදුසු විනය ක්‍රියාමාර්ග සභාපති, පේරාදෙණිය විශ්ව විද්‍යාල පාලක සභාව විසින් ගත යුතු අතර, ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතුය.

2024.03 .21 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් හා මේ සම්බන්ධව අදාළ වගඋත්තරකරුවන්ට එරෙහිව පියවර ගැනීමේ බලය පවත්නා සභාපති ඇතුළු විශ්ව විද්‍යාල පාලක සභාවේ සියළු සාමාජිකයන් වෙත දන්වා සිටිමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

| | | | |
|---|---|---|---|
| 01. | ගරු අමාත්‍ය සුරේෂ් රාගවන් මහතා,<br>උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය,<br>ඉසුරුපාය, බත්තරමුල්ල. | - දැනගැනීම සහ සුදුසු කටයුතු සඳහා |
| 02. | ලේකම්,<br>උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය,<br>ඉසුරුපාය, බත්තරමුල්ල. | - දැනගැනීම සහ සුදුසු කටයුතු සඳහා |
| 03. | සභාපති සහ සියළුම සාමාජිකයින්<br>විශ්ව විද්‍යාල පාලක සභාව (පේරාදෙණිය)<br>පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය. | - අවශ්‍ය පියවර ගෙන වාර්තා කිරීම සඳහා |
| 04. | සභාපති,<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව<br>වෝඩ් පෙදෙස, කොළඹ 08. | - දැනගැනීම පිණිස |
| 05. | ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරී,<br>මානව හිමිකම් කොමිෂන් සභාව,මහනුවර. | |

B/